# යුරෝපා ඉතිහාසය

## 7.1.2 විප්ලවයේ ගමන් මග



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education




**ප්‍රංශ විප්ලවයට ආසන්න ම හේතුව - : ආණ්ඩුවේ මුදල් අර්බුදය නිසා උද්ගත වූ තත්ත්වය යි.**

රජය මුහුණ පා සිටි මූල්‍යමය අර්බුදය තර්ජනාත්මක අවස්ථාවකට වර්ධනය වීමත් සමග හමුදාවට වේතන ගෙවා ගැනීමවත් කළ නොහැකි තත්ත්වයකට රාජ්‍ය භාණ්ඩාගාරය පත් විය. මේ තත්ත්වයට පිළියම් වශයෙන් බදු ප්‍රතිසංස්කරණය කළ යුතු විය. ඒ සඳහා ස්ටේට්ස් ජෙනරාල් සභාව නම් මන්ත්‍රණ සභාව කැඳවීමට රජු තීරණය කළේ ය. මෙම සභාව වසර 175 ක් පමණ කාලයක් තිස්සේ කැඳවා නොතිබූ බැවින් සභා වාර පැවැත්වීම පිළිබද ගැටලු පැන නැගුණි. රදල පන්තිය, පූජක පන්තිය හා සාමාන්‍ය ජනතාව නියෝජනය කළ පිරිස් මෙම සභාවට අයත් විය. මෙහි දී පළමුවන ප්‍රජා ගණය නියෝජනය කළ පූජකවරු සහ දෙවන ප්‍රජා ගණය නියෝජනය කළ වංශාධිපතිවරු වෙන ම සභාවක් ( උත්තර මණ්ඩලයක් ) ලෙස වෙන ම රැස්විය යුතුයැයි වංශාධිපතිවරු විසින් යෝජනා කරන ලදි. එහි අරමුණ වූයේ තුන්වන ප්‍රජා ගණය එනම් පොදු ජනතාව නොසලකා හැරීම යි. නමුත් රජය මුහුණපා සිටින ප්‍රශ්න හමුවේ සාකච්ඡා කිරීම සඳහා මෙම කණ්ඩායම් තුනට ම අයත් නියෝජිතයන් එකම ස්ථානයකට රැස්විය යුතු යැයි තුන්වන ප්‍රජා ගණය විසින් ඉල්ලා සිටින ලදි. නමුත් වංශාධිපතියන්ගේ මතයට එකඟ වූ රජු එම ඉල්ලීම නොසලකා හැරිය බැවින් රජු හා මහජනතාව අතර ගැටුම් ආරම්භ විය. අනෙක් ප්‍රජා ගණ දෙකට අයත් නියෝජිතයන් කීපදෙනෙකු සමග අසල තිබූ ටෙනිස් පිටියකට රැස් වූ තුන්වන ප්‍රජා ගණයේ නියෝජිතයන් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කර අවසාන වන තෙක් ආපසු සිය නිවෙස් බලා නොයෙන බවට දිවුරා පොරොන්දු වූහ. එය " ටෙනිස් පිටියේ දිවරුම " යනුවෙන් හැඳින්වේ. රජුගේ විධායක බලතල සීමා කරන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමට ඔවුහු බලාපොරොත්තු වූහ.

රජු විසින් ටර්ගෝ ඇමතිවරයා සේවයෙන් පහ කරනු ලැබූ අවස්ථාවේ දී ඊළඟ පියවර වශයෙන් සැලකූ මධ්‍යකාලීන අවධියට අයත් බලකොටුවක් වැනි වූ බැස්ටිල් බන්ධනාගාරයට පහර දී **1789 ජූලි 04** දින එය බිඳ දැමූහ. එහි සිටි ආරක්ෂක භටයන් මරා දැමූ අතර දේශපාලන සිරකරුවන් නිදහස් කෙරිණි. විප්ලවවාදීන් විසින් පැරිසියේ සිට රාජකීය නිලධාරීන් පලවා හැර ඔවුන්ගේ ආණ්ඩුවක් පිහිටුවා ගැනීමත් සමග රජුගේ බලය තවත් දුර්වල විය. පැරිසියේ මෙම කැරලිකාර පිරිස මර්දනය කිරීම පිණිස රජු හමුදාව කැඳවන ලදි. මේ නිසා මහජනතාවගේ කෝපය තවත් වැඩි විය. සාගින්නෙන් පෙලුණ කාන්තාවෝ වර්සේල්ස් මාලිගය වටලා පාන් ඉල්ලා කෑ ගසන ලදි. ඔවුන්ට එහිදී සතුටුදායක ප්‍රතිචාර නොලැබුණ බැවින් මාලිගාව තුළට වැදී එය කොල්ල කෑහ. රජු, බිසව සහ ඔවුන්ගේ දරුවන්ට පැරීසිය අත්හැර යෑමට ඉඩ නොදී එහි වාසය කිරීමට බල කළහ.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- එච්.ඒ. හංසිකා සෙව්වංගි මෙනවිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ.ඩී. නිමල් මයා ශාන්ත ජෝසප් විද්‍යාලය කොළඹ 14 අන්තර්ගතය පරීක්ෂා කිරීම :- කේ. ඒ.ඩී. නිමල් මයා ශාන්ත ජෝසප් විද්‍යාලය කොළඹ 14
Copyright © www.e-thaksalawa.moe.gov.lk
Copyright © www.e-thaksalawa.moe.gov.lk

1791 වන විට අලුත් ආණ්ඩුක්‍රමය කෙටුම්පත් කොට අවසන් කළ අතර ඒ යටතේ රජුගේ බලය බෙහෙවින් අඩු කොට තිබුණි. නීති සම්පාදනය කිරීමේ බලය ව්‍යවස්ථාදායක මණ්ඩලය වෙත පවරාගත් අතර එම මණ්ඩලය බදු ගෙවන රට වැසියාගේ ඡන්දයෙන් තෝරා පත් කරගැනීමට විධි විධාන යොදා තිබුණි. රජු මෙම අලුත් ව්‍යවස්ථාව පිළිගැනීමට කිසිසේත්ම කැමති නොවී ය. නමුත් එය අනුමත කිරීම හැර වෙන කළ හැකි දෙයක් ඔහුට නොවී ය. ප්‍රභූවරුන්ට විරුද්ධව ගොවි ජනතාව කැරලි ගසා සිටි ගම්බද ප්‍රදේශවල පැවති තත්ත්වයත් ප්‍රංශ දේශසීමාවේ පිහිටි ඕස්ට්‍රියව සමග යුද්ධයක් ආරම්භ වීමට ආසන්නව පැවති තත්ත්වයත් දෙස බැලූ රජුට තමා රටින් පලායාම නුවණට හුරු බව අවබෝධ විය. 1791 දී ජූලි මස දී ඔහු සිය පවුල සමග රටින් පලා යාමට ප්‍රයත්න දැරූ නමුත් ප්‍රංශ දේශ සීමාවේ වරෙයුනෙස් නගරයේ දී ඔවුන් අල්ලා ගනු ලැබිණි. ඒ අනුව ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුවක් ගොඩනැගීමට ප්‍රයත්න දැරූ මධ්‍යස්ථවාදීන්ගේ අපේක්ෂාව ද එයින් අවසන් විය. රජු මෙසේ රාජද්‍රෝහී වීමේ වරදට සිහසුනෙන් පහ කොට 1792 දී ඔහුගේ හිස ගසා දමනු ලැබිණි. මේ සඳහා ගිලටීනය නැමැති උපකරණය යොදා ගන්නා ලදි.

මෙලෙස 16 වන ලුවී රජුගේ හිස ගසා දැමීම නිසා අසල්වැසි රටවල රජවරු කම්පාවට හා භීතියට පත් වූ අතර ප්‍රංශයේ විප්ලවවාදීන් එම රටවල් සමග යුද වැදීම නොවැළැක්විය හැකි තත්ත්වයකට පත් විය. රජුගේ හිස ගසා දැමීමත් සමග අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අක්‍රිය වූ අතර ප්‍රංශය තුළ අරාජික තත්ත්වයක් වර්ධනය විය. එහෙයින් 1792 සැප්තැම්බර් මාසයේ දී රැස් වූ ජාතික සම්මේලනය නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම ආරම්භ කරන ලදි. එමගින් ප්‍රංශයේ රාජාණ්ඩුක්‍රමය අහෝසි කෙරුණු අතර ප්‍රංශය සමූහ ආණ්ඩුවක් බව ප්‍රකාශයට පත් කෙරිණි. එමගින් ඩාන්ටන් සහ රොබෙස්පියර් වැනි අන්තවාදී නායකයන්ගේ ප්‍රධානත්වයෙන් යුත් මහජන ආරක්ෂක කමිටුවක් ද පත් කළ අතර එම නායකයන්ට අසීමිත බලතල පවරා දෙන ලදි. එම අලුත් පාලන සංවිධානය යටතේ භීෂණ සමයක් ආරම්භ විය. ( 1792 සැප්. 1794 ජූලි ) එහි දී මධ්‍යස්ථවාදී පිරොන්ඩ්වරුන් ඝාතනය කෙරුණි. රාජාණ්ඩුවට පක්ෂපාතීකම් දැක්වූ පොදු ජනතාව හා ප්‍රභූවරු දහස් ගණනක් දංගෙඩියට ගොදුරු කරන ලදි. එසේ මරා දමන ලද ප්‍රසිද්ධ කාන්තාවන් අතර මාරි ඇන්ටොයිනට් බිසව සහ බැරේ ආර්යාව ද වූහ. විප්ලවවාදීන් විසින් පිහිටුවා ගන්නා ලද ජාතික ආරක්ෂක හමුදාවේ නායකත්වය දරන ලද්දේ ලෆොයට් නම් පුද්ගලයා විසිනි.



← ගිලටීනය


Copyright © www.e-thaksalawa.moe.gov.lk